**තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව - 2021**

-----------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී .

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව;
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව;

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.9,441,684 ක්වූ දේපළ පිරියත හා උපකරණ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු සටහනෙහිද දේපළ පිරියත හා උපකරණවල ක්ෂය අනුපාත හෙළිදරව් කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට දේපල පිරියත හා උපකරණ සුදුසු ක්ෂය ප්‍රතිශතයන් තීරණය කර ක්ෂය කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා අනුගමනය කරන ගිණුම්කරණ ක්‍රමය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ක්ෂය කරද නොතිබුණි. | ප්‍රාග්ධන ප්‍රදාන ක්ෂය කිරීම ඉදිරි වසරේ සිට සිදු කරන අතර කොමිෂන් සභාව ප්‍රථම වරට ගිණුම් ඉදිරිපත් කළ බැවින් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ක්‍රමය අතපසුවීමකින් මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි. ඉදිරි වසරේ සිට එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා අනුගමනය කරන ගිණුම්කරණ ක්‍රමය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පරිගණක උපාංග මිලදී ගැනීම සඳහා මුදලින් වැය කර තිබුණු රු.429,657 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.512,157 ක් ලෙස දක්වා තිබුණු අතර රු.82,500 ක්වූ අත්තිකාරම් වියදමේ අඩුවීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | ගිණුම්කරණ හා වැටුප් සකස් කිරීමේ මෘදුකාංගය ස්ථාපනය කිරීම සඳහා 2020 වර්ෂයේදී ගෙවූ සියයට 50 අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කිරීම නිසා මෙම වෙනස සිදුවී ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| දේපළ පිරියත හා උපකරණ | 8,677,962 | තහවුරු කර ගැනීමට අදාල තක්සේරු වාර්තා සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තා | කොමිෂන් සභාව සඳහා මිලදී ගත් සියලුම දේපල පිරියත හා උපකරණ පිරිවැය මත ගිණුම්ගත කර ඇති අතර කොමිෂන් සභාව සඳහා ලබාදී ඇති උපකරණවල | ශේෂය තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගත්මිල හෝ පිරිවැය නොදන්නා බැවින් එම උපකරණවල වටිනාකම තක්සේරු කමිටුවක් හරහා තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | සියළුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වූ වාර්තා තබා ගත යුතු වුවත් විගණන දිනය වූ 2022 සැප්තැම්බර් 26 වන විටත් කොමිෂන් සභාව ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දීම අනුව ඇඟිලි සලකුණු කිරීමේ යන්ත්‍රයක් සවි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව සඳහන් කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | කොමිෂන් සභාව විසින් වර්ෂය 2021 සඳහාමානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2021 වර්ෂයේ COVID 19 වාතාවරණය යටතේ එය සිදු කිරීමට නොහැකි වුවත් 2021 දෙසැම්බර් මස ලිපිගොනු නඩත්තුව පිළිබඳ වැඩසටහනක් සිදු කරන ලදී. නමුත් 2022 වර්ෂයට මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | | |
| (i) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛය | කොමිෂන් සභාව විසින් වර්ෂය 2021 සඳහාසකස් කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම චක්‍රලේඛ ප්‍රකාරව නොතිබුණි. | 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම කොමිෂන් සභාව සතුව පවතින අතර එහි පිටපතක් මේ සමග ඉදිරිපත් කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |
| (ii)2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛය | කොමිෂන් සභාව විසින් 2021 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කළද කොමිෂන් සභාවේ සේවක පුරප්පාඩුව පැවතීම මත හා සේවයේ නියුතුව සිටි නිලධාරීන්ගෙන් වැඩිපිරිසක් පුරප්පාඩු තනතුරුවල රාජකාරි ආවරණය සඳහා යෙදවීමට සිදු වීම මත සහ කොවිඩ් වසංගත තත්ත්වය මත නිලධාරීන් සේවයට කැඳවීමද සීමාවීම හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ කටයුතු ප්‍රමාද විය. එසේ වුවත්, භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.72,237 ක ඌනතාවයක් විය. කොමිෂන් සභාව සමාලෝචිත වර්ෂයේදී ප්‍රථම වරට සංස්ථාවක් ලෙස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලයේ සැසඳීමක් කළ නොහැකි විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට වෙනම අරමුදලක් තිබිය යුතු | 2019 වර්ෂයේ සිට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා | පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට වෙනම අරමුදලක් පිහිටුවා ගත යුතුය. |

| | | |
|---|---|---|
| වුවත්, විගණන දිනය වූ 2022 සැප්තැම්බර් 26 දින වන විටත් එවැනි අරමුදලක් පිහිටුවීමට අපොහොසත් වී ති බුණි. | විගණකාධිපතිතුමා සමඟ සාකච්ඡා පවත්වමින් මෙම අරමුදල සඳහා අවශ්‍ය බැංකු ගිණුම විවෘත කිරීමට කොමිෂන් සභාව විසින් මහත් පරිශ්‍රමයක් දරා ඇත. ඒ අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ලබාදුන් උපදෙස් අනුව අරමුදල පිහිටුවීම ඉතා ඉක්මනින් සිදුකිරීමට කොමිෂන් සභාව අපේක්ෂා කරයි. | |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 13 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා අධ්‍යක්ෂ ජනරාල්වරයා වන අතර කොමිෂන් සභාවේ වැඩ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන බවට තීරණය කරනු ලබන නිලධාරීන් හා සේවා නියුක්තිකයින් සංඛ්‍යාවක් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු වේ. ඒ අනුව කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 26 ක් වුවත් තත්‍ය සේවක සංඛ්‍යාව 14 ක් වූයෙන් පුරප්පාඩු 12 ක් පැවතුණි. ඒ අතර ප්‍රධාන විධායක නිලධාරී තනතුරද පුරප්පාඩුව පැවතුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2020 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කරනු ලබන අතර එම චක්‍රලේඛය ඉවත් කළ පසු ඉදිරියේදී පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගනු ලැබේ. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |

**4.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 21 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යවසායන් විසින් ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද කොමිෂන් සභාව විසින් මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2022 මැයි 23 දිනදීය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන දින 84 ක ප්‍රමාදයකින් යුතුව විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2016 අංක 16 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතෙහි 11(1) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රථමවරට සිදු කරනු ලැබුවේ 2021 වර්ෂය සඳහා වේ. එහිදී ඇතිවූ විවිධ ගැටළුකාරී තත්ත්වයන් මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම 2022 පෙබරවාරි මස අවසානයේදී අවසන් කරනු ලැබුවද, මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා 2022 මාර්තු 30 දින ඉදිරිපත් කරන ලදී. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. | රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යවසායන් විසින් ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |